VERITÉ RESEARCH
Strategic Analysis for Asia

NO.5A POLICE PARK PLACE, COLOMBO 00500, SRI LANKA
TEL: + 94 11 2055544; FAX: +94 71 9379567
EMAIL: RECEPTION@VERITERESEARCH.ORG

# මත්පැන් මිල දී ගැනීම කාන්තාවන්ට තහනම් කිරීමට ගනු ලැබූ කැබිනට් තීරණය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූල නැත.

මත්පැන් මිලදී ගැනීමට කාන්තාවන්ට අවසරය හිමිව තිබිණි. වසර 2018 ජනවාරි 10 වන දින මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් 1912 අංක 8 දරන සංශෝධිත සුරාබදු ආඥා පනත යටතේ අංක 2/2018 දරන සුරාබදු නිවේදනය නිකුත් කරනු ලැබීය. අලුත් නිවේදනය මඟින් 1979 දෙසැම්බර් 31 අංක 666 දරන සුරාබදු නිවේදනය සංශෝධනය කරන ලද අතර එමඟින් කාන්තාවන්ට 'තැබෑරුම් පරිශ්‍රයකදී' මත්පැන් විකිණීමට මෙතෙක් පැවති තහනම ඉවත් කරන ලදී.[1] සාමාන්‍යයෙන් තැබෑරුමක් යනුවෙන් හඳුන්වන්නේ "අදාළ ස්ථානයේදීම මත්පැන් මිල දී ගෙන පානය කර හැකි විනෝදාත්මක ස්ථානයක් හෝ නිවාසයකි".[2] ඒ අනුව වසර 2018 ජනවාරි 10 වන දින සිට ශ්‍රී ලංකාවේ නීතිය යටතේ කාන්තාවන්ට මත්පැන් මිලදී ගැනීමට අයිතිය පවතී. තව දුරටත්, 666 දරන සුරාබදු නිවේදනය තැබෑරුමක් නොවන ස්ථානයක දී, උදාහරණ ලෙස සුපිරි වෙළඳසැල් වල දී කාන්තාවන් විසින් මත්පැන් මිලදී ගැනීම තහනම් කිරීමට කටයුතු නොකරන බව දක්නට ලැබෙන්නකි.

නීතිය ඉදිරියේ සමානත්වය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (1) ව්‍යවස්ථාව දක්වන්නේ සෑම පුද්ගලයෙක්ටම නීතිය ඉදිරියේ සමාන බව හා නීතියේ සමාන ආරක්ෂාව ලැබීමට අයිතිය ඇති බවයි. තව දුරටත් එහි 12(2) ව්‍යවස්ථාව දක්වන්නේ 'කිසිදු පුද්ගලයෙකු ස්ත්‍රී පුරුෂභාවය මත වෙනස් කමකට භාජනය නොකර යුතු බවයි....' ඒ අනුව ස්ත්‍රී පුරුෂභාවය මත කාන්තාවන් වෙනස් කමකට භාජනය කරන ක්‍රියාවන් තුළින් ඔවුන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වන අතර එබැවින් එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූල නැත.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 16 (1) ව්‍යවස්ථාව දක්වන්නේ 'දැනට බලාත්මකව පවතින සෑම ලිඛිත මෙන්ම අලිඛිත නීතියක් ම මෙම පරිච්ඡේදයේ ඉහත වගන්ති හා කුමන ආකාරයෙන් නොගැලපීම් පැවතිය ද නීත්‍යානුකූල හා බලාත්මක වන බවයි'. 16 (1) ව්‍යවස්ථාව අදාළ වන්නේ වසර 1978ට පෙර බලාත්මකව පැවති ලිඛිත හා අලිඛිත නීති සඳහා පමණි. ඒ අනුව අද දවසේ බලාත්මක කරන ඕනෑම නීතියක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයට අනුකූල විය යුතු අතර ස්ත්‍රී පුරුෂභාවය මත වෙනස්කමකට භාජනය කරන නීති විය නොහැක.

කැබිනට් තීරණය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූල නැත. වසර 2018 ජනවාරි 16 වන දින කැබිනට් මණ්ඩලය විසින් 2/2018 දරන කාන්තාවන්ට 'තැබෑරුම් පරිශ්‍රයක දී' මත්පැන් විකිණීමට මෙතෙක් පැවති තහනම ඉවත් කරන ලද ඉහතින් දැක්වූ සුරාබදු නිවේදනය අහෝසි කිරීමට ඒකමතිකව තීරණය කරනු ලැබීය.[3] මෙම තීරණය කාන්තාවන් විසින් තැබෑරුම් පරිශ්‍රයකින් මත්පැන් මිලදී ගැනීම තහනම් කිරීමට මඟ පාදන අතර මෙය සිදු වන්නේ 1979 දෙසැම්බර් 31 අංක 666 දරන සුරාබදු නිවේදනය යටතේ පැවති තහනම නැවත බලාත්මක වීමෙනි. ඒ අනුව මෙම කැබිනට් තීරණය කාන්තාවන්ගේ ස්ත්‍රී පුරුෂභාවය මත ඔවුන්ව වෙනස්කමකට භාජනය කරයි. වසර 2018 ජනවාරි 16 දිනැති නව තීරණය ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පනවනු ලබන අවස්ථාවේ දී 'පවතින ලිඛිත හෝ අලිඛිත නීති' යන වර්ගීකරණයට නොගැනෙන නිසා, එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 16 (1) ව්‍යවස්ථාව තුළින් ආරක්ෂාව ලබන්නේ නැත.

---

[1] පැවති වගන්තිය, අංක 666 31 ෙදසැම්බර් 1979 දරන සුරාබදු නිවේදනය 11 (C )වන වගන්තිය

[2] බ්ලැක්ස් ලෝ ශබ්දකෝෂය, 4වන සංස්කරණය 1968, : http://heimatundrecht.de/sites/default/files/dokumente/Black%27sLaw4th.pdf [සම්බන්ධිත දිනය: 2018 ජනවාරි 17 වන දින].

[3] "මත්පැන් සම්බන්ධ ගැසට් පත්‍රය අහෝසි කිරීමට කැබිනට් මණ්ඩලය තීරණය කරයි", අද දෙරණ, 2018 ජනවාරි 16, : http://www.adaderana.lk/news/45440/cabinet-decides-to-withdraw-gazettes-on-liquor [සම්බන්ධිත දිනය: 2018 ජනවාරි 16].

මෙහි බරපතල මූලික අයිතිවාසිකම් උල්ලංඝනයක් පවතී. 126 (1)වන ව්‍යවස්ථාව අනුව විධායක හෝ පරිපාලන ක්‍රියාවක් නිසා යම් මූලික අයිතිවාසිකමක් උල්ලංඝනය හෝ බරපතල ලෙස උල්ලංඝනයවී ඇතැයි ප්‍රශ්න ගතව ඇති විටක එය විමසීමේ සහ තීරණයක් ලබා දීමේ පරම සහ සම්පූර්ණ බලය ශ්‍රේෂ්ඨාධිකරණයට ලබා දී තිබේ. වසර 2018 ජනවාරි 16 දිනැති කැබිනට් මණ්ඩල තීරණය "විධායක තීරණ" යන වර්ගීකරණයට ගැනෙන්නකි.[4] තව දුරටත් මෙම තීරණය මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය වරයා විසින් අහෝසි කරන ලද්දක ප්‍රතිඵලයක් නිසා අංක 2/2018 දරන සුරාබදු නිවේදනය අහෝසි කිරීමට ගනු ලැබූ තීරණය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (2)වන ව්‍යවස්ථාව බරපතල ලෙස උල්ලංඝනය කරන්නකි. මෙම අහෝසි කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) හා (2)වන ව්‍යවස්ථාවන් මගින් පිළිගෙන ඇති සමානාත්මතාවයට හා වෙනස්කමකට භාජනය නොවීමට කාන්තාවන්ට ඇති අයිතිය උල්ලංඝනය කිරීමක් නිර්මාණය කරයි. ඒ අනුව තම මූලික අයිතිවාසිකම් උල්ලංඝනයව ඇතැයි විශ්වාස කරන මේ සඳහා උනන්දු පාර්ශවයන්ට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 17වන ව්‍යවස්ථාව සමඟ කියවෙන 126වන ව්‍යවස්ථාව යටතේ ශ්‍රේෂ්ඨාධිකරණය වෙත පෙත්සමක් යොමු කිරීමට නීත්‍යානුකූල පදනම් පවතී.

[4] සුගතපාල මෙන්ඩිස් සහ තවත් අයෙක් එදිරිව චන්ද්‍රිකා බන්ඩාරනායක කුමාරතුංග සහ තවත් අය (වෝටර්ස් එජ් ණඩු තීරණය) [2008] 2 SLR 339; පෙරේරා එදිරිව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව [1978-79-80] 1 SLR 128 137-138 පිටු, හී දී ෂර්වානන්ද විනිසුරු තුමා ට අනුව, "විධායක හෝ පරිපාලන ක්‍රියා යන ප්‍රකාශනයට ආණ්ඩු බලය ක්‍රියාත්මක කරන රාජ්‍යය හෝ එහි නියෝජිතයෙකු හෝ වෙන යම් ආයතනයක් ඇතුලත් වේ. එය රාජ්‍ය බලය භාවිත කරන සෑම ස්වරූපයක් සඳහා ම යෙදෙන්නකි."